# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2081/48 - 2018 ජූලි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2018.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පඩිපාලක සභා ආඥා පනත

### නිවේදනයයි

### ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වන අධිකාරය) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තිය යටතේ ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥා පනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2018 අගෝස්තු මස 01 දින සිට වලංගු විය යුතුය.

එස්. ඒ. එන්. සරණතිස්ස,
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2018 ජූලි මස 26 වැනි දින,
කොළඹ 05.

### උපලේඛනය

ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ, පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 1966 මාර්තු මස 25 වැනි දින අංක 14688 දරන අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කල වෙනස් කරන ලද්ද වූද, අවසන්වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්ද වූද, එකී උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II කොටස

කම්කරුවන්ගේ පන්තිය -

| | | |
|---|---|---|
| (i) | (අ) වැනි ශ්‍රේණිය | මෝස්තරකරුවෝ හෝ ඩිසයිනර්වරු, ඇඳුම් මසන්නෝ, ඩිසයින් පන්ච් කරන්නෝ, ඩිස්කට් සකසන්නෝ |
| | (ආ) වැනි ශ්‍රේණිය | ප්‍රධානීන් නොහොත් අංශ පරිපාලකවරු |

| | |
|---|---|
| (II) වැනි ශ්‍රේණිය | ඇඳුම් කපන්නෝ (අතින්), ඇඳුම් කපන්නෝ, යන්ත්‍ර අළුත්වැඩියා කරන්නෝ, අවසාන වරට හරි වැරදි බලන්නෝ |
| (III) වැනි ශ්‍රේණිය | හරි වැරදි බලන්නෝ සහ තෝරන්නෝ, රෙදි මදින කම්කරුවෝ, විවිධ වැඩ කරන (ගැහැණු) කම්කරුවෝ, මුද්‍රා තබන (ගැහැණු) කම්කරුවෝ, රෙදි මදින්නෝ (ගැහැණු), මහන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, නිකුත් කරන (ගැහැණු) කම්කරුවෝ, මැෂින්/අතින් එම්බ්‍රොයිඩර් කරන්නෝ |
| (IV) වැනි ශ්‍රේණිය | රෙදි අතුරන්නෝ (පිරිමි), රෙදි අතුරන්නෝ (ගැහැණු), අසුරන්නෝ, සෙලෝපේන් හා කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, නුපුහුණු කම්කරුවෝ, ගබඩා කම්කරුවෝ |
| (V) වැනි ශ්‍රේණිය | ආධුනිකයන් හා පුහුණුවන්නන් |

ඉහත සඳහන් යම් වෘත්තිය ආධුනිකයෙකුගේ හෝ පුහුණුවන්නකුගේ ආධුනික කාලය වැඩ කරන දින 156කින් යුක්ත විය යුතුය.

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වර්ෂය | I (අ) ශ්‍රේණිය | I (ආ) ශ්‍රේණිය | II ශ්‍රේණිය | III ශ්‍රේණිය | IV ශ්‍රේණිය | V ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 1 සේවා වර්ෂය | 14,650.00 | 14,100.00 | 12,700.00 | 12,600.00 | 12,000.00 | 7,500.00 |
| 2 සේවා වර්ෂය | 14,850.00 | 14,275.00 | 12,850.00 | 12,725.00 | 12,100.00 | |
| 3 සේවා වර්ෂය | 15,050.00 | 14,450.00 | 13,000.00 | 12,850.00 | 12,200.00 | |
| 4 සේවා වර්ෂය | 15,250.00 | 14,625.00 | 13,150.00 | 12,975.00 | 12,300.00 | |
| 5 සේවා වර්ෂය | 15,450.00 | 14,800.00 | 13,300.00 | 13,100.00 | 12,400.00 | |

08 - 469

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.